# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1691/47 - 2011 පෙබරවාරි 02 වැනි බදාදා - 2011.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත**

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වැනි වගන්තිය යටතේ දෙනු ලබන විධානය.

කේ. එම්. ඒ. එන්. දවුලගල,
අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින,

2010 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම මූලික ප්‍රාග්ධන) විධානය

හැඳින්වීම

1. මෙම විධානය 2010 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම මූලික ප්‍රාග්ධන) විධානය යනුවෙන් හඳුන්වන අතර, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වැනි වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානයන්ට අනුව පොදු සමාගමක් වන (මෙහි මින්මතු "විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) සියලු ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයකට ම අදාළ වේ. මෙම විධානය වහාම බලපවත්වන පරිදි ක්‍රියාත්මක වේ.

ඉදිරි වර්ෂ 5 සඳහා අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය

2. සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් ම පහත සඳහන් අගයන්ට නොඅඩු වූ ක්ෂය නොවූ මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු වේ :–

| *අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධන අවශ්‍යතාවය (රු.මිලියන)* | *බලපවත්වන දිනය* |
|---|---|
| 100 | 2012.01.01 දින සිට |
| 150 | 2013.01.01 දින සිට |
| 200 | 2014.01.01 දින සිට |
| 250 | 2015.01.01 දින සිට |
| 300 | 2016.01.01 දින සිට |

මූලික ප්‍රාග්ධන නිර්වචනය

3. "මූලික ප්‍රාග්ධනය" යන්නෙන්, පහත සඳහන් අයිතමයන්ගේ එකතුව අදහස් වේ :–

(අ) *නිකුත් කළ සහ ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය*

සංචිත හෝ අතිරික්ත හෝ රඳවා ගත් ලාභවලට එරෙහිව නිකුත් කළ කොටස් හැර අනෙක් නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය/සාමාන්‍ය තොග සහ අධික් ගෙවා නිමි සාමාන්‍ය කොටස් තොග සඳහා ගෙවා නිමි අගය ;

(ආ) *අසමුච්චිත හා නිදහස් කළ නොහැකි වරණීය කොටස් ප්‍රාග්ධනය*

අසම්පූර්ණ හෝ අර්ධ ලෙස ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභ නොමැති විට ලාභාංශ ගෙවීම ස්ථිර වශයෙන් අඩුකර ගත හැකි හෝ අත්හැරිය හැකිවන නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ අසමුච්චිත හා නිදහස් කළ නොහැකි වරණීය කොටස් ;

(ඇ) *කොටස් අධි මිල*

සාමාන්‍ය කොටස් සහ අසම්මුචිත හා නිදහස් කළ නොහැකි වරණීය කොටස්වලට අදාලවන නාමික අගය ඉක්ම වූ නිකුතු මිල ;

(ඈ) *ව්‍යවස්ථාපිත සංචිත අරමුදල*

2006 අංක 05 දරන කල්බදු මූල්‍යකරණ (සංචිත අරමුදල) විධානයට අනුව පවත්වාගෙන යා යුතු සංචිත අරමුදලේ බැර ශේෂය ;

(ඉ) *සාමාන්‍ය හෝ වෙනත් නිදහස් සංචිත*

අවසන් වරට විගණනය කළ මූල්‍ය වාර්තාවල දැක්වෙන පරිදි රඳවා ගත් ලාභ, කොටස් අධි මිල හෝ වෙනත් උපලබ්ධි වූ සංචිතවලින් විසර්ජනය කිරීමෙන් නිර්මාණය කළ හෝ වැඩි කරන ලද සාමාන්‍ය හෝ වෙනත් සංචිත ස්වරූපයෙන් අනාවරණය කළ සංචිත ;

(ඊ) *ප්‍රකාශිත රඳවා ගත් ලාභ/(සමුච්චිත අලාභ)*

පෙර මුදල් වර්ෂයන්ගෙන් රැගෙන ආ ලාභාලාභ ගිණුමේ දැක්වෙන සහ අවසන් විගණනය කළ මූල්‍ය වාර්තාවල දැක්වෙන, දේපොල ආයෝජනවල ප්‍රත්‍යාගණනය මගින් පැන නැගුණු අතිරික්ත හැර ශේෂය ;

(උ) *වර්තමාන වර්ෂයේ අප්‍රකාශිත ලාභ/(අලාභ)*

අවසන් විගණනය කළ මූල්‍ය වාර්තා නිමවන දින සිට [ස්ථාවර සහ දිගුකාලීන ආයෝජන විකිණීමෙන් ලද බදු අය කිරීමෙන් පසු අතිරික්ත හෝ (අලාභ) හැර] වර්තමාන වර්ෂයේ ලාභය හෝ අලාභය ;

(ඌ) *ස්ථාවර සහ දිගු කාලීන ආයෝජන විකිණීමෙන් ලද බදු පසු අතිරික්ත හෝ අලාභ*

විගණනය කළ මූල්‍ය වාර්තා නිමවන දින සිට ස්ථාවර සහ දිගු කාලීන ආයෝජන විකිණීමෙන් ලද බදු අය කිරීමෙන් පසු අතිරික්ත හෝ (අලාභ).

2006 අංක 1 දරන විධානය අහෝසි කිරීම

4. 2006 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම ප්‍රාග්ධන) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ.

02-435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.